TRADE
(Part-IV)

S. Madushanka

B.Sc (Mgt) Accounting (Special) (U.G)

University of of Sri Jayewardenepura

විදේශ වෙළෙඳාම

යම් රටක් වෙනත් රටක් හෝ රටවල් සමග සිදු කරන වෙළෙඳාම විදේශ වෙළෙඳාම වේ.

විදේශ වෙළෙඳාම සඳහා පදනම් වී ඇති සාධක

ස්වභාවික සම්පත් බෙදී යාමේ විෂමතාව

යම් යම් රටවලට සමහර ස්වභාවික සම්පත් උරුම වී ඇති ආකාරය විෂම වීම නිසා ඒ ආශ්‍රිත නිෂ්පාදිත සිදු කළ හැක්කේ එම රටවලට පමණි

නිදසුන් :

මැද පෙරදිග - ඛණිජ තෙල්

ද. අප්‍රිකාව - රතත් රන්

ශ්‍රී ලංකාව - තේ

ClassWork.LK

<u>සාපේක්ෂ පිරිවැය වාසිය</u>

රටක් භාණ්ඩ ආනයනය කිරීමට සාපේක්ෂ ව අඩු පිරිවැයකින් නිපදවිය හැකි නම් එම භාණ්ඩ නිපදවා අපනයනය කළ යුතු බවත්, භාණ්ඩය නිපදවීමට සාපේක්ෂව අඩු පිරිවැයකින් ආනයනය කළ හැකි නම් එම භාණ්ඩ ආනයනය කළ යුතු බවත් මින් අදහස් වේ.

නිදසුන් :

ශ්‍රී ලංකාව - ඇගළුම් නිෂ්පාදනය

<u>සමහර නිෂ්පාදිත සම්බන්ධ ව සමහර රටවල නීතිමය ඒකාධිකාරයක් තිබීම (Patant & Copyright)</u>

<u>සමහර නිෂ්පාදන සඳහා අවශ්‍ය නිපුණතාව හා තාක්ෂණය සෑම රටකට ම නො මැති වීම හෝ සීමා වීම</u>

නිදසුන් :

රොබෝ තාක්ෂණය

මෝටර් රථ තාක්ෂණය

ClassWork.LK

භාණ්ඩ ප්‍රවර්ධනය

තම නිෂ්පාදිත ලොව පුරා අලෙවි කර ගැනීම සඳහා විවිධ ප්‍රවර්ධන උපක්‍රම භාවිත කිරීම

වෙළෙඳ බාධක අවම වීම

වෙළෙඳාම සඳහා තිබූ තීරු බදු සහ තීරු බදු නො වන සම්බාධක බොහොමයක් ඉවත් වීම

ClassWork.LK

විදේශ වෙළෙඳාමේ ප්‍රභේද

- ආනයන වෙළෙඳාම - Imports
- අපනයන වෙළෙඳාම - Exports
- ප්‍රති අපනයන - Re Exports
- අන්තරාල වෙළෙඳාම - Entrepot Trade

ආනයන වෙළෙඳාම

කිසියම් රටක් විදේශ රටකින් හෝ රටවලින් භාණ්ඩ හා සේවා ගෙන්වීම ආනයන වෙළෙඳාම වේ.

නිදසුන් :

ශ්‍රී ලංකාවට ජපානයෙන් මෝටර් රථ ගෙන්වීම

ClassWork.LK

අපනයන වෙළෙඳාම

කිසියම් රටක් විදේශ රටකට හෝ රටවලට භාණ්ඩ හා සේවා යැවීම අපනයන වෙළෙඳාම වේ.

නිදසුන් :
ශ්‍රී ලංකාවෙන් ඉරාකයට තේ යැවීම

ප්‍රතිඅපනයන වෙළෙඳාම

කිසියම් රටකින් ආනයනය කරන ලද ද්‍රව්‍ය රට තුළට ගෙනැවිත් වෙනසකට භාජනය කර හෝ නො කර නැවත වෙනත් රටකට හෝ රටවලට යැවීම ප්‍රතිඅපනයන වෙළෙඳාම වේ. මෙහි දී ආනයන අවස්ථාවේ දී ගෙවූ තීරුබදු අපනයනය කරන විට ආපසු අය කර ගත හැකි ය.

නිදසුන් :
රෙදිපිළි සහ අනෙකුත් ද්‍රව්‍ය ආනයනය කර ඇගළුම් සකස් කර වෙනත් රටකට අපනයනය කිරීම

ClassWork.LK

අන්තරාල වෙළෙඳාම

විදේශ රටකින් ආනයනය කරන ලද ද්‍රව්‍ය රට තුළට නො ගෙන වරාය තුළ නැවත සකසා හෝ සැකසීමකින් තොර ව නැවත වෙනත් රටකට හෝ රටවලට අපනයනය කිරීම අන්තරාල වෙළෙඳාම ලෙස හැඳින්වේ. මෙම ක්‍රියාවලය වරාය තුළ සිදු වන නිසා තීරු ගාස්තු අය කිරීමක් සිදු නො වේ.

නිදසුන් :

ශ්‍රී ලංකාවට ඉන්දියාවෙන් තේ ආනයනය කර ඉරානයට අපනයනය කිරීම

ClassWork.LK

රටක් විදේශ වෙළෙඳාමේ නිරත වීමෙන් අත් කර ගත හැකි ප්‍රතිලාභ

- අතිරික්ත නිෂ්පාදිත අපනයනය කළ හැකි වීම
- රටේ නිපදවිය නො හැකි නිෂ්පාදිත ආනයනය කළ හැකි වීම
- විදේශ විනිමය උපයා ගත හැකි වීම
- ආර්ථික පිරිමැසුම් අත් කර ගත හැකි වීම
  විදේශ වෙළෙඳාම නිසා දේශීය වෙළෙඳපොළට පමණක් නොව ගෝලීය වෙළෙඳපොළ සඳහා ද නිෂ්පාදනය කෙරේ. මෙසේ පුළුල් වෙළෙඳපොළක් සඳහා නිෂ්පාදනය මහා පරිමාණ ව සිදු කිරීම නිසා ආර්ථික පිරිමැසුම් ඇති කර ගත හැකි වේ.
- ජාත්‍යන්තර වෙළෙඳ සබඳතා හා ජාත්‍යන්තර සහයෝගීතාව වර්ධනය වීම
- නව තාක්ෂණික හා කළමනාකරණ නිපුණතා වර්ධනය වීම

ClassWork.LK

- ආර්ථික සංවර්ධනයට පිටුවහලක් වීම

නිදසුන් :

- රැකියා උත්පාදනය
- ජනතාවගේ ජීවන මට්ටම උසස් වීම
- සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීම

ClassWork.LK

නිදහස් වෙළෙඳාම

කිසිඳු බාධාවකින් තොර ව විවිධ පාර්ශ්වයන්ට නිදහසේ භාණ්ඩ ආනයනය හා අපනයනය කිරීමට අවකාශයක් පැවතීම නිදහස් වෙළෙඳාම වේ.

නිදහස් වෙළෙඳාමට ඇති බාධක

නිදහස් වෙළෙඳාමට ඇති බාධක තීරුබදු හා තීරුබදු නො වන බාධක ලෙස වර්ග කෙරේ.

- රටවල් අතර වෙළෙඳාමේ දී **තීරු බදු පැනවීම** නිදහස් වෙළෙඳාමට බාධාවක් වේ.

- තීරු බදු අය කිරීමට අමතර ව නිදහස් වෙළෙඳාමට බලපාන අනෙකුත් **බාධා තීරු නො වන බාධා** ලෙස හැඳින්වේ.

නිදසුන් :

- ආනයන සීමා කිරීම් / පංගු කිරීම්
- අපනයන සීමා කිරීම් / පංගු කිරීම්
- ආනයන/අපනයන තහනම් කිරීම්
- වෙළෙඳ ගිවිසුම්
- දැඩි විනිමය ප්‍රතිපත්ති

ClassWork.LK

2021
2022
2023

උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

තනි හෝ කණ්ඩායම් පන්ති

(English & Sinhala Medium)

0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura